# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

World Health Organization
Sri Lanka

සෞඛ්‍ය සහ දේශීය
වෛද්‍ය සේවා අමාත්‍යාංශය

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ
සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
මහ නගර සභාව

## 7. ප්‍රසිද්ධ රැස්වීම් (එළිමහන් සහ ගෘහස්ථ)

වර්තමාන තත්වය යටතේ ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීම (එළිමහන් හා ගෘහස්ථ) දැඩි ලෙස අනුමත නොකෙරේ. එබැවින්, සහභාගිවන්නන් අවම කිරීම සඳහා අන්තර්ජාලය / සමාජ මාධ්‍ය හරහා මාර්ගගත ප්‍රවාහය භාවිතා කිරීම සහ ජනමාධ්‍ය භාවිතා කිරීම වඩාත් සුදුසුය. ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීම අත්‍යවශ්‍ය යැයි සලකන අවස්ථාවක පහත සඳහන් කරුණු සලකා බැලිය යුතුය.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**සංවිධායකයින්**

- රැස්වීම හැකිතාක් කෙටි කරන්න.
- සීමිත ප්‍රදේශයක් තුළ සහභාගිවන්නන්ගේ ඝනත්වය සලකා බලන්න. එබැවින්, මීටර 1 ක දුරක් පවත්වා ගත හැකි පුද්ගලයින් සංඛ්‍යාවට පමණක් ඇතුළුවීමට අවසර දිය යුතුය.
- මීටර 1 ක පරතරයකින් පැහැදිලිව සලකුණු කර ඇති ආසන සකස් කිරීම වඩාත් සුදුසුය.
- සියලුම සහභාගිවන්නන් නිසි පරිදි මුහුණු ආවරණ පැළඳ සිටින බවට සහතික විය යුතුය.
- රැස්වීමේ ආරම්භයේදීම වැළැක්වීමේ පියවරයන් දැනුම් දී නියමිත වේලාවට එය මතක් කරන්න.
- සියලුම සහභාගිවන්නන් සඳහා සබන් හා ජලය සමග අත් සේදීම සඳහා පහසුකම් පිළියෙළ කිරීම හෝ දොරටුවේ ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කරක පහසුකම් සැපයීම. රැස්වීම් භූමියට ඇතුළු වීමට පෙර සහ රැස්වීමෙන් පසු පිටත්ව යාමට පෙර අත් පිරිසිදු කර ගන්නා ලෙස සියලුම සහභාගිවන්නන්ට උපදෙස් දිය යුතුය.
- රැස්වීම ගෘහස්ථව පවත්වනු ලැබුවහොත් රැස්වීම් ස්ථානය හොඳින් වාතාශ්‍රය ඇතිව තබා ගත යුතු අතර දොරවල් ස්පර්ශ කිරීම වළක්වා ගැනීම සඳහා හැකි සෑම අවස්ථාවකම ස්ථානයට යන දොරවල් විවෘතව තබන්න.
- සියළුම සහභාගිවන්නන් අතට අත දීම හෝ වෙනත් කිසිම ආයුරක ස්පර්ශ කිරීමකින් වැළකී සිටිය යුතුය.
- රැස්වීමේදී ආහාර හා පාන වර්ග සපයනු ලබන්නේ නම්, ආහාර පරිහරණය කරන/සේවය කරන පුද්ගලයින්, සබන් යොදා අත් සේදීම, මාර්ගෝපදේශ පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. ස්වයං සේවා බුෆේ නොපවත්වන්න.
- පාවිච්චි කරන ලද කඩදාසි සර්විියට් සහ ඉවතලන ද්‍රව්‍ය ඉවතලීම සඳහා සංවෘත බඳුනක් සැපයිය යුතුය.
- රැස්වීමට පෙර සහ පසුව විෂබීජ නාශක ද්‍රව්‍යකින්, නිතර ස්පර්ශ කරන ලද මතුපිට සහ වස්තූන් පිරිසිදු කරන්න.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම සංවිධායක වරයාගේ වගකීම වේ.

**සම්මේලනයේ / සම්මන්ත්‍රණයේ සහභාගිවන්නන්**

- ඔබට ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් රැස්වීමට සහභාගී නොවන්න.
- රැස්වීම පුරාම එකිනෙකාගෙන් මීටර් 1 ක දුරක් පවත්වා ගන්න.
- මුහුණු ආවරණයක් නිසි ලෙස පැළඳිය යුතුය.
- පහසුකම් තිබේ නම්, සබන් හා වතුරෙන් අත් සේදීම හෝ රැස්වීම් භූමියට ඇතුළු වීමට පෙර ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කරක භාවිතයෙන් විෂබීජහරණය කරන්න.
- වෙනත් සහභාගිවන්නන් සමඟ ශාරීරික සම්බන්ධතා පැවැත්වීමෙන් වළකින්න.
- නිතර ස්පර්ශ වන පෘෂ්ඨයන් උදා: දොර හැසිරවීම්, රේල් පීලි ආදිය අනවශ්‍ය ලෙස ස්පර්ශ නොකරන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- රැස්වීම ආරම්භයේ දී සහ නියමිත වේලාවට උපදෙස් දැනුම් දෙන්න.




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.